# හතේ විත්ති හතක්







ආදර්ශ්නා ගජේන්ද්‍රා

# හතේ විත්ති හතක්

ආදර්ශනා ගජේන්ද්‍රා

කතෘගේ වෙනත් කෘති

1.ගුරුතුමීට තෑග්ගක් ISBN 978-624-206-592-2(15.11.2023)

2.කවි මුතු වැල් ISBN 978-624-206-593-9(15.11.2023)

3.The Little seed's big adventure ISBN 978-624-206-715-5(15.11.2023)

4. Caterpillar's Magical journey ISBN 978-624-206-716-2(15.11.2023)

5. The Little Raindrop ISBN 978-624-206-717-9(15.11.2023)

6.Everyone is Special ISBN 978-624-206-718-6(15.11.2023)

7.අත්තම්මගෙ දත වැටිලා ISBN 978-624-208-095-6 (15.11.2013)

# කතෘගෙන් වචනයක්........

"හතේ විත්ති හතක්" පොතේ ඇතුලත් වන්නේ

ලෝකයේ සහ ලංකාවේ හතක් බැගින් විස්තර වන දේවල්ය.

අහම්බයෙන් මට මඟදී හමුවී ලෝකය පිළිබඳ සොයන්නට මා උනන්දු කළ සමන්මලී ගුරුමෑණියනි,

ඔබ නිසා මා නොයෙක් දේ ගැන කියවීමට පුරුදුවුණා.

ඒ වගේම මගේ පන්තිභාර ගුරුතුමිය නෙරන්ජලා වීරසිංහ ගුරුමෑණිය මා පොත් ලියන්නට උනන්දු කළා.

එහි ප්‍රතිඵලය මේ පොතයි.

මම මේ පොත ,ඔබ දෙදෙනාටත් ,මගේ යහළුවන් සියලුදෙනාටමත්, අනෙකුත් සැමටත් ආදරයෙන් සහ ගෞරවයෙන් පිළිගන්වමි.

තොරතුරු සහ පින්තූර අන්තර්ජාලයෙනි.

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු ,සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත්, බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම්, පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන අවශ්‍යතාවයක් සපුරාලීම කි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ" දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් දි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය -මහනුවර

2023.10.20

# ලෝකයේ පුදුම හත

යාළුවනේ ඔයාලා දන්නවද? ලෝකයේ පුදුම හතක් තියෙනවා කියලා? ලෝකයේ පැරැන්නන් නිර්මාණකළ ඉතා විශාල පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් දේවල් හතක් තියෙනවා. ඒවා ක්‍රිස්තු වර්ෂ 2007 සිට ලෝකයේ පුදුම සහගත දේවල් විදිහට නම් කරලා තියෙනවා. මොනවද මේ පුදුම හත?



## 1. බ්‍රසීලයේ රියෝද ජෙනයිරෝ නුවර ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රතිමාව

බ්‍රසීලයේ රියෝද ජෙනයිරෝ නුවර ටිජුකා ජාතික වනෝද්‍යානයේ තිබෙන කොරකෝවාඩො කඳු මුදුනේ තමයි මේ ප්‍රතිමාව හදලා තියෙන්නේ. මේ විශාල ප්‍රතිමාව මුළු නගරයම පෙනෙන විදියට හදලා තියෙන්නේ.

ප්‍රංශ ජාතික මූර්ති ශිල්පියෙකු වන පෝල් ලැඩෝව්වුස්කිගේ නිර්මාණයක්. සදා නිමකළේ 1931 ඔක්තෝබර් 12 දා.

උස මීටර් 38 ක් වන අතර බර ටොන් 635 ක්.



# 2.චීන මහා ප්‍රාකාරය

විශාල බැම්මක්. කාලෙන් කාලෙට චීනයේ රජ කරපු විවිධ රජවරුන් මෙයට කොටස් එකතු කළා . එම නිසා මෙහි වැඩකටයුතු ක්‍රිස්තුපූර්ව 6 වන සියවසේ දී පමණ ආරම්භ කර ක්‍රිස්තු පූර්ව 16 වන සියවස දක්වාම ඉදිකිරීම්, ප්‍රතිසංස්ක චීන මහා ප්‍රාකාරය ,චීනයේ පැරණි උතුරුසීමාව දිගේ නිර්මාණය වුණ රණ සහ සංරක්ෂණ කටයුතු සිදු වෙලා තියෙනවා.

දිග කිලෝමීටර් 21196.

අඩිතාලම සාදා ඇත්තේ කළුගල් වලින්. ගඩොල් බැම්ම මීටර් දොළහක් උසයි. ප්‍රාකාරය මුදුනේ අඩි හතර හමාරක් පළල පාරක් තියෙනවා. මීටර් එකසිය අසූවෙන් එකසිය අසූවට මුර කුලුණු හදා තියෙනවා. චීන අධිරාජ්‍යයේ උතුරු සීමාවට නිතරම වාගේ එල්ලවුණු මොංගෝලියානු ආක්‍රමණවලින් රට බේරා ගැනීමටයි පැරණි චීන අධිරාජ්‍යවරුන් මෙම විශාල ප්‍රාකාරය ඉදිකර තිබෙන්නේ.



# 3. ඉතාලියේ කොලෝසියම

මෙය  පිහිටා තියෙන්නේ ඉතාලියේ අපි කවුරුත් දන්න ලස්සන රෝම නගරයේ. මෙය පැරැණි ඉතා විශාල ප්‍රේක්ෂකාගාරයක්. ඉහළ පැලැන්තියේ මිනිසුන්ගේ සතුට වෙනුවෙන් මෙහි අමානුෂික ක්‍රීඩා සිදුවී ඇති බව දැනගන්නට තිබෙනවා. මරණය තෙක් සිදුකරන කඩු හරඹා දරුණු වන සතුන් සමග මරණය තෙක් සටන් කිරීමට යොදවන ලද සිරකරුවන්ගේ ක්‍රීඩා ඔවුන් සතුටු වන්නට යොදාගෙන තිබෙනවා.

ඒ වගේ වන මෘගයන් රඳවා තැබීමට ඉදිකරපු කාමර පේළියක නටබුන් අදටත් ඉතිරිවී තිබෙනවා. නිතර ගින්නට සහ අකුණු සැර වැදීම් වලට මුහුණ දීම නිසා දැනට ඉතිරි වෙලා තිබෙන්නේ කොටසක් පමණයි.



# 4.පෙට්‍රා නගරය

පෙට්‍රා නගරය කියන්නේ ඉතා පැරණි නැබටියානු රාජධානියේ අගනුවර. එහි රජු ක්‍රිස්තුපූර්ව 9 සිට ක්‍රි.පූර්ව 40 දක්වා රජ කළ ඇරේටස් රජු.

මෙය පැරණි දියුණු වෙළඳ මධ්‍යස්ථානයක්. ඒනිසා ඉතා දියුණු නගරයක්ව තිබුණු බවයි සැලකෙන්නේ.

අරාබි කාන්තාරයේ කෙළවරක පිහිටා ඇති නිසා කාන්තාර දේශගුණයට ඔරොත්තු දෙන විදියටයි මෙය හදලා තියෙන්නේ. රෝස පාට ගල් වර්ගයක් මෙය සෑදීමට යොදාගෙන තියෙනවා.



# 5.පේරුහි මාචූ පීචූ බලකොටුව

මාචූ පීචූ බලකොටුව පිහිටා තියෙන්නෙ අමෙරිකාවේ ඇන්ඩීස් කඳුමුදුනේ. ඉන්කා නැමති පැරණි අධිරාජ්‍යයේ බලකොටුවයි. ක්‍රිස්තු වර්ෂ 1500 දී පමණ තමයි හදල තියෙන්නෙ. ඉන්කාවරුන්ගේ “නැතිවුන නගරය” නමින්ද මෙය හඳුන්වනවා. ලෝක උරුම ස්ථානයක් ලෙස නම් කළේ 1983 දී.

ඉන්කා ගෘහ නිර්මාණ ශිල්පීන් මෙය වියලි ගඩොලින් සාදා තිබෙනවා. විශේෂත්වය වන්නේ ගඩොල් එකිනෙක සවිකිරීමට බදාම භාවිතා නොකර තිබීමයි.



# 6.චිචෙන් ඉට්සා පූජනීය  නගරය

මෙය පැරණි කොලුම්බියානු ශිෂ්ඨාචාරයට අයිතියි. එහි ජීවත් වූ මායන්වරුන් විසින් මෙය හදලා තියෙන්නෙ. මෙම පැරණි නගරයේ ගොඩනැඟිලි සීයකට වැඩි ප්‍රමාණයක් තිබුණු බවට තොරතුරු තියෙනවා. මේ නගරයේ තිබෙන කුකුල්කන් දේවස්ථානයේ උස මීටර් 24ක්. හැඩය පිරමීඩයක් වගේ. හතර පැත්තෙන් පඩිපෙළි හතරක් තියෙනවා. එක පේලියක පඩි අනූ එකක් තිබෙනවා. පඩි ගණන අවුරුද්දකට ඇති දවස් ගණනට සමානයි. කියන්නේ 365ක්. දැනට ඉතිරි වෙලා තියෙන්නේ ගොඩනැගිලි තිහක නටබුන් විතරයි.



## 7. ඉන්දියාවේ ටජ් මහල් මන්දිරය

ඉන්දියාවේ රජකළ මෝගල් රාජ පරම්පරාවේ ෂා ජහාන් රජු තමන් ගොඩක් ආදරය කරපු බිසවගේ මරණයෙන් පස්සේ, ඇගේ දේහය තැන්පත් කිරීමට මේ විශාල මාළිගය ඉදිකරලා තියෙන්නේ. ඒ බිසව තමයි මුම්ටාස් මහල් දේවිය. මේ සිහිවටනය හදල තියෙන්නෙ කිරිගරුඬ කියන පාෂාණ වර්ගයෙන්. මෙය පිහිටලා තියෙන්නේ යමුනා ගංගාව ළඟ. සේවකයන් විසිදාහකට අවුරුදු දහ අටක් මේ මාළිගය හදන්න කල්ගතවී තිබෙනවා.



# හත්දින්නත් තරු

හත්දින්නත් තරු කියන්නෙ තරු හතකින් යුත් තරු පොකුරක්. “Seven sisters” කියලත් මේ තරු පොකුර හඳුන්වනවා. ලෝකයේ ඕනෑම තැනක සිට නැරඹිය හැකි තරු පොකුරක් ලෙසයි සැලකෙන්නේ. ග්‍රීක මිථ්‍යා විශ්වාස වලට අනුව විවිධ කතන්දර මේ ගැන තියෙනවා. ඇට්ලස් දෙවියන්ගේ සහ ප්ලෙයෝන් දෙවඟනගේ දූවරු හත්දෙනා කියල කියන්නේ හත්දින්නත් තරුවලට. ග්‍රීක භාෂාවෙන් මෙයාලට පරෙයියන් හත් දෙනා හෙවත් ප්ලෙයිඩේස් කියලත් කියනවා. මුලින්ම මේ අය කඳුවල දෙවඟනන් ලෙසත් හඳුන්වලා තියෙනවා. . පැරැණි ග්‍රීක කතා වලට අනුව මේ සහෝදරියන් අල්ලා ගන්නට යෝධ දඩයක්කාරයා හෙවත් ඕරායන් අවුරුදු හතක් උත්සාහ කළාලු . පස්සේ සියුස් දෙවියන් ඔවුන්ගේ ආරක්ෂාවට ඒ අය තරු හතක් බවට පත් කළාලු . අපි කවුරුත් දන්න වෙනත් රටවල ඔක්තෝබර් මාසයේ සමරන හැලෝවීන් උත්සවයත් මේ සත් සහෝදරියන්ට සම්බන්ධයි. හත්දින්නත් තරු රටාව මධ්‍යම රාත්‍රියේ අහස මුදුනට පැමිණෙනවාත් සමඟ ජීවිතය සහ මරණය අතර තිරය තුනී වෙනව කියල ඔවුන් විශ්වාස කරනවා. හැලෝවීන් රාත්‍රියට එයාලා මැරුණ අය සමරනවා.

හත්දින්නත් තරු තමයි,

මයියා - Maia

ඉලෙක්ට්‍රා - Electra

ටේගෙට් - Taygete

සෙලීනෝ -Celeno

ඇල්සියොන්- Alcyone

ස්ටෙරෝප් - Sterope

මෙරෝප් - Merope



ග්‍රීක භාෂාවෙන් මයියා කියන්නේ ශ්‍රේෂ්ඨ මව. එයා වසන්තයට අධිපති දෙවඟනයි. එයාට කරන ගෞරවයක් විදියට තමයි මැයි මාසය එනම් වසන්තයේ මාසයට ඒ නම දාලා තියෙන්නේ.

ඇල්සියෝන් තරු පොකුරේ දීප්තිමත්ම තාරකාවයි.

# හත්මුතු පරම්පරාව

ඔයාලා අහලා ඇති නේද කවුරු හරි කියනවා "අපේ හත්මුතු පරම්පරාවේවත් එහෙම කෙනෙක් ඉඳලා නෑ" කියලා. මොකක්ද මේ හත්මුතු පරම්පරාව? හත්මුතු පරම්පරාව කියන්නේ අපේ අම්මාගේ අප්පච්චිගේ ඉඳලා පසුපසට පරම්පරා හතක්.

අත්තා - පියාගේ පියා

මුත්තා - අත්තාගේ පියා

කිත්තා - මුත්තාගේ පියා

කිරිකිත්තා - චිත්තාගේ පියා

නත්තා - කිරිකිත්තාගේ පියා

පනත්තා - නත්තාගේ පියා

මීමුත්තා - පනත්තාගේ පියා



# මහාද්වීප හත

මහාද්වීපයක් කියලා කියන්නේ අපේ  මහ පොළොවේ තියෙන එකට බැඳුණු විශාල ගොඩබිම් ප්‍රදේශයකට. දැනට ලෝකයේ ගොඩබිම් මහද්වීප හතකට බෙදලා තියෙනවා. එක මහද්වීපයකට රටවල් ගොඩක් අයිති වෙනවා. ඒවා පිළිවෙලින්,

ආසියා මහද්වීපය

අප්‍රිකා මහද්වීපය

උතුරු ඇමරිකා මහද්වීපය

දකුණු ඇමරිකා මහද්වීපය

ඇන්ටාක්ටිකා මහද්වීපය

යුරෝපා මහද්වීපය

ඔස්ට්‍රේලියා මහද්වීපය




ලෝකයේ විශාලම මහද්වීපය ශ්‍රී ලංකාවේ අපිත් ඉන්න ආසියා මහද්වීපයයි. ආසියා මහාද්වීපයට රටවල් 48ක් අයිතියි. චීනය ,රුසියාව ,ඉන්දියාව සහ ජපානය ආසියාවේ බලවත් රටවල් .ආසියාව තවත් කොටස් 5 කට බෙදලා තියෙන්නේ . ඒ තමයි

නැගෙනහිර ,දකුණු ,මධ්‍යම , අග්නිදිග ,බටහිර

අපේ ලංකාව අයිති දකුණු ආසියාවට.

ආසියා මහාද්වීපයේ විශාලම රට රුසියාව වන අතර කුඩාම රට මාල දිවයිනයි.

ලෝකයේ කුඩාම මහද්වීපය ඔස්ට්‍රේලියා මහද්වීපයයි



(ASIAN)
RUSSIA
KAZAKHSTAN
MONGOLIA
TURKEY
SYRIA
IRAQ
IRAN
AFGHANISTAN
PAKISTAN
CHINA
NORTH KOREA
SOUTH KOREA
JAPAN
SAUDI ARABIA
OMAN
YEMEN
INDIA
NEPAL
BHUTAN
MYANMAR
LAOS
THAILAND
CAMBODIA
VIETNAM
TAIWAN
PHILIPPINES
SRI LANKA
MALDIVES
MALAYSIA
BRUNEI
INDONESIA

# මුහුදු හත

මුහුදු හතට සාමාන්‍ය කතාබහේදී අපි සත් සමුදුර කියලත් කියනවා. සත් සමුදුරින් එහා යනවා කියලා කියන්නේ. මේක විශේෂයෙන්ම ධීවරයන් භාවිතා කරන වචනයක්.



**කහ මුහුද**

මුහුදු වෙරළේ ඉඳලා සැතපුම් භාගයක් පමණ දුරට තියෙන්නේ කහ මුහුද.

**කොළ මුහුද**

කහ මුහුදේ ඉඳලා සැතපුමක් දුරට විහිදිලා තියෙන මුහුද කොළ මුහුදයි.

**නලමාලි මුහුද**

කොළ මුහුදට පස්සේ තියෙන මුහුදේ ටිකක් සුළඟ සැර වැඩි නිසා ඒ මුහුද හඳුන්වන්නේ නලමාලි මුහුද කියල.

**රතු මුහුද**

නලමාලි මුහුදට පස්සේ තියෙන්නේ රතු මුහුද.මේ මුහුද දෙපැත්තේ මුහුදු පැලෑටි වැවෙන නිසා රෑට රතු පාටින් දිලිසෙනවා. ඒ නිසයි ඒකට රතු මුහුද කියල කියන්නෙ.

**කලුමුහුද**

රතු මුහුදට පස්සෙ තියෙන්නෙ කලුමුහුද. බල මාළු වැඩියෙන් ඉන්නේ කළුමුහුදෙ කියලා ධීවරයන් විශ්වාස කරනවා.

**සුදු මුහුද**

තෝරු මෝරු වගේ වටිනා මාලු වර්ග වාසය කරන්නේ මේ සුදු මුහුදේ නිසා ධීවරයන්ට වටිනාම මුහුද සුදු මුහුද. හොඳට සවි ශක්තිය තියෙන ධීවරයන් තමයි සුදු මුහුදෙ මාළු අල්ලන්න යන්නේ. රෑට හඳ එළිය වැටෙද්දී කිරි සුදු පාටින් පෙනෙන නිසා කිරිමුහුද කියලත් කියනවාලු.

**ගොළු මුහුද**

මේ තමයි අන්තිම මුහුද. මේ මුහුද ගැඹුරු නිසා සද්ද බද්ද නෑ. ඒ නිසා ගොළු මුහුද කියල කියනවා. හිම මිදෙන්නේ ගොළු මුහුදෙලු.

# සප්ත ස්වර.

ස්වර හතේ උපත සිදුවී ඇත්තේ සතුන්ගේ හඬවල් ආශ්‍රයෙන් බව සාහිත්‍යයේ සඳහන් වෙනවා. සප්ත ස්වරය අපි සංගීතයේදී භාවිතා කරනවා. පැරණි ශ්ලෝකයකට අනුව,

ෂඩ්ජ

ඍෂභ

ගාන්ධාර

මධ්‍යම

පංචම

ධෛවත

නිෂාද

කියල කියන්නේ ස්වර හතට. ශබ්ද කිරීමට අපහසු නිසා මේ වචන හතේ මුල් අකුරු පමණක් ගෙන ස්වර හත නිර්මාණය කරලා තියෙන්නේ.

ස- මොණරාගේ හඬ

රි-කෑදත්තාගේ හඬ

ග-එළුවාගේ හඬ

ම-කොස්වා ලිහිණියාගේ හඬ

ධ- අශ්වයාගේ හඬ

නි- ඇතාගේ හඬ



# සප්ත අපරිහානිය ධර්ම

අපේ බුදුරජාණන් වහන්සේ ,කිසියම් රටක පිරිහීම වළක්වා ගැනීමට පිළිපැදිය යුතු ධර්ම හතක් දේශනා කර තිබෙනවා. බුදුරජාණන් වහන්සේගේ කාලයේ ලිච්ඡවි රාජ්‍යයේ පාලකයන් විසින් සප්ත අපරිහානීය ධර්මය පිළිපැද ඇති බවයි සඳහන් වෙන්නේ.

1.සමගිව රැස්වී තම රාජ්‍යයේ ගැටලු මිනිසුන්ගේ රෝග පීඩා දියුණුවීම් පිළිබඳ සාකච්ඡා කිරීම.

2. සාකච්ඡා අවසානයේ සාමකාමීව විසිරයාම.

3. අතීත රජවරුන් පැනවූ නීති රීති ඒ ආකාරයෙන් ආරක්ෂා කිරීම; කඩ නොකිරීම; අතිරේක නීති නොපැනවීම.

4. වැඩිහිටි තම රජ පරපුරේ අයට ගරු කිරීම ඔවුන්ගේ අවවාද අනුශාසනා ගැනීම.

5. ස්ත්‍රීන්, දැරියන්, කුල කුමාරිකාවන් ආරක්ෂා කිරීම; ඔවුන්ට අකටයුතුකම් සිදු නොකිරීම.

6. පූජ්‍යස්ථානයන්ට ගරු සත්තාර කිරීම; ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.

රහතන් වහන්සේලාගෙන් හා මහණ බමුණන්ගෙන් අවවාද අනුශාසනා ලබා ගැනීම හා ඒ උතුමන් ආරක්ෂා කිරීම.

අපේ රටේ පාලකයන් ඇතුළු අපි සියලු දෙනාම සප්ත අපරිහානීය ධර්ම පිළිපැද්දොත්, පිරිහී විනාශ වී ඇති අපේ රටේ අනාගතයේදී ලස්සන රටක් බවට පත්කර ගැනීමට හැකිවේවි.



පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයටඑකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත් කතුවරියන් ය. පාසල තුළ ගොඩනැඟී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයෙ ගුණාත්මක දියුනුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම් කරුවන් ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශ්වයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

" දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග ඇහුවා විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතු වරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20

